# අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

# ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය

# ශ්‍රී ලංකා ජර්මානු පුහුණු ආයතනය - (කිලිනොච්චිය ශාඛාව)

## පුරප්පාඩු

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයෙහි වෘත්තීය අධ්‍යාපන අංශය යටතේ පවතින ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ ශාඛාවක් වන කිලිනොච්චිය ශ්‍රී ලංකා ජර්මානු පුහුණු ආයතනයේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා ස්ථිර පදනම මත බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.**

### 01. ශාඛා විදුහල්පති (HM 1-3) - තනතුරු 01

**සුදුසුකම්:-**

**බාහිර:-**

ඉංජිනේරු, ව්‍යාපාර පරිපාලන, රාජ්‍ය පරිපාලන, වාණිජ, විද්‍යාව හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් ඕනෑම උපාධියක් ලබා තිබීම.

සමග

අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකමක් (ශාස්ත්‍රපති) හෝ පිළිගත් වෘත්තිය වරලත් ආයතනයක, තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ ආශ්‍රිත සාමාජිකත්ව (ඉංජිනේරු තනතුර සඳහා ආයතනික සාමාජිකත්වය)

සහ

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමින් අවම වශයෙන් අවුරුදු 15 ක පළපුරුද්දක් එයින් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර දෙකක (02) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**අභ්‍යන්තර:-**

බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය වන සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

හෝ

තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයක නියෝජ්‍ය ශාඛා විදුහල්පති (HM 1-1) තනතුරක අවම වශයෙන් වසර දෙකක (02) ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය -**

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව,
HM 1-3 - Rs.152,500 - 4,100x15 - Rs.214,000/-
(මීට අමතරව රජය මගින් අනුමත දීමනාවන් සඳහා හිමිකම් ලබයි)
2026.01.01 දිනට වැටුප - රු. 133,028.00

**බඳවා ගැනීමේ ක්‍රමය -**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව -**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 35ට නොඅඩු හා 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාවක් අදාල නොවේ.

### 02. නියෝජ්‍ය ශාඛා විදුහල්පති (HM 1-1) - තනතුරු 01

**සුදුසුකම්:-**

**බාහිර:-**

ඉංජිනේරු, ව්‍යාපාර පරිපාලන, රාජ්‍ය පරිපාලන, වා❑ජ, විද්‍යාව හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් ඕනෑම උපාධියක් ලබා තිබීම.

සමග

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකමක් (ශාස්ත්‍රපති) හෝ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක, තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ ආශ්‍රිත සාමාජිකත්වය (ඉංජිනේරු තනතුර සඳහා ආයතනික සාමාජිකත්වය)

සහ

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමින් අවම වශයෙන් අවුරුදු 13 ක පළපුරුද්දක් තිබීම සමග ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර දෙකක (02) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**අභ්‍යන්තර:-**

බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය වන සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

හෝ

පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පශ්චාත් උපාධි හෝ ආශ්‍රිත සාමාජිකත්වය සමඟ, තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකාර කාණ්ඩයේ (MM 1-1) ශ්‍රේණියේ අවම වශයෙන් අවුරුදු තුනක (03) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම (ඉංජිනේරු තනතුර සඳහා ආයතනික සාමාජිකත්වය)

**වැටුප් පරිමාණය -**

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව,
HM 1-1 - Rs.140,640 - 4,100x15 - Rs.202,140/-
(මීට අමතරව රජය මගින් අනුමත දීමනාවන් සඳහා හිමිකම් ලබයි)
2026.01.01 දිනට වැටුප - රු. 123,019.00

**බඳවා ගැනීමේ ක්‍රමය -**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව -**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 35ට නොඅඩු හා 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාවක් අදාල නොවේ.

### 03. කළමනාකරණ සහකාර-තාක්ෂණික නොවන (MA 1-2) - තනතුරු 03

**සුදුසුකම්:-**

**බාහිර:-**

අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් පැරණි නිර්දේශය යටතේ විෂයයන් හතරකින් හෝ නව නිර්දේශය යටතේ විෂයයන් තුනකින් සමත් වීම.

සහ

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/ දෙමළ භාෂාව හා ගණිතය ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හතරකින් සමත් වීම.

**අභ්‍යන්තර:-**

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/ දෙමළ භාෂාව හා ගණිතය විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයකින් සමත් වී දැනට ප්‍රාථමික - ශිල්පීය නොවන (PL 1) - හා ප්‍රාථමික - ශිල්පීය (PL 3) වැටුප් කාණ්ඩයේ අයට මේ සඳහා අයදුම් කල හැක.

**වැටුප් පරිමාණය -**

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව,
MA 1-2- රු.46,220 - 540x10 - 630x7 - 1080x12 - 1280x12 -රු.84,350/-
(මීට අමතරව රජය මගින් අනුමත දීමනාවන් සඳහා හිමිකම් ලබයි)
2026.01.01 දිනට වැටුප - රු. 43,312.00

**බඳවා ගැනීමේ ක්‍රමය -**

තරගකාරී ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව -**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාවක් අදාල නොවේ.

### 04. රියැදුරු - (PL 3) - තනතුරු 02

**සුදුසුකම්:-**

**බාහිර:-**

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් විෂයයන් 02 කින් සමත්වීම සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන බර වාහන පැදවීමේ වලංගු රියැදුරු බලපත්‍රයක් ලබා ගැනීමෙන් පසු රිය පැදවීම පිළිබඳ වසර 03ක අවම පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර:-**

බර වාහන පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද බලපත්‍රය ලබාගෙන රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබීම සහ ප්‍රාථමික නුපුහුණු සේවා කාණ්ඩයෙහි (PL 1) අවම වශයෙන් වසර පහක (05) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය -**

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව,
PL 3 - රු. 43,280 - 490x10 - 540x10 - 590x10 - 630x12 - රු.67,040/-
(මීට අමතරව රජය මගින් අනුමත ජීවන වියදම් දීමනාව සඳහා හිමිකම් ලබයි)
2026.01.01 දිනට වැටුප - රු. 40,834.00

**බඳවා ගැනීමේ ක්‍රමය -**

ප්‍රායෝගික පරීක්ෂණයක ප්‍රතිඵල මත සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව -**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාවක් අදාල නොවේ.

**තනතුරු සඳහා අදාළ පොදු කොන්දේසි -**

- සියළුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- මානසික හා කායික වශයෙන් දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට සුදුසු විය යුතුය.
- ඉතා යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
- ඉහත තනතුරට බඳවා ගන්නා බාහිර අයදුම්කරුවන් වසර 03ක පරිවාස කාලයක් සැපිරිය යුතුය. ඔහු/ඇය එම කාලසීමාව අවසානයේදී පෙන්වනු ලබන සතුටුදායක කාර්ය සාධනය සහ පැවැත්ම අනුව, තනතුරෙහි ස්ථිර කරනු ඇත. දැනටමත් තනතුරෙහි ස්ථිර කර ඇති අයදුම්කරුවන් වසර 01ක වැඩබලන කාලසීමාවකට යටත් වනු ඇත.
- ඉහත තනතුරට බඳවා ගැනීම් අදාල තනතුරෙහි ආරම්භක වැටුප් පියවරට වේ.
- සේවක අර්ථසාධක අරමුදල සඳහා වැටුපෙන් 8%ක් අයකර ගනු ලබන අතර ඊට ආයතනයේ දායකත්වය 12%ක් හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා 3%ක් වේ.

අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල ඡායා පිටපත් ස්වකීය අයදුම්පත සමග අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය
(ආ) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික
(ඇ) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික
(ඈ) ජාතික හැඳුනුම්පත

දැනට රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ දෙපාර්තමේන්තුවල සේවය කරන අය තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් එවිය යුතු අතර අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු/ ඇය සේවයෙන් නිදහස් කළ හැකි බවට ආයතන ප්‍රධානියා සහතික කළ යුතුය. ඥාතීන් නොවන ඔබ පිළිබඳව විමසිය හැකි දෙදෙනෙකු ඇතුළත්ව සම්පූර්ණ විස්තර සහිත අයදුම්පතක් තමා විසින් සහතික කරන ලද සහතිකවල පිටපත් සමග **2026.03.15 දිනට ප්‍රථම කළමනාකාර - පරිපාලන හා මානව සම්පත්, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය, අංක 582, ගාලු පාර, ගල්කිස්ස** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි අයදුම් කරන තනතුර නිවැරදිව සඳහන් කළයුතු අතර කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර අවසාන දිනට පසු ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.

බඳවා ගැනීමට කිසිදු ආකාරයකින් බලපෑමක් කිරීම බඳවා ගැනීමට නුසුදුසුකමක් වනු ඇත.

**අධ්‍යක්ෂ - විදුහල්පති,**
**ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය,**
**අංක 582, ගාලු පාර,**
**ගල්කිස්ස.**